**බලංගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 08 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍යප්‍රකාශන 2013 පෙබරවාරි27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 18 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
--------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| 1.21 ඡේදය | | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග ස්කන්ධය වෙනස්වීම් සම්බන්ධ ප්‍රකාශනයක් ඉදිරිපත් කරනොතිබුණි. |
| 1.24 ඡේදය | (අ) | අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා වෙන වෙනම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| | (ආ) | අයවැයගත සංඛ්‍යා ඉක්මවා නැති බවට හෝ ඉක්මවා තිබෙන විට ඒවා මූල්‍ය ප්‍රකාශනවල පාද සටහනක් ලෙස හෝ අනාවරණය කර නොතිබුණි. |

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවට ලැබෙන මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් උපචිත පදනමට හඳුනාගත්තදසාවද්‍යා ලෙස මුදල් පදනම මතහඳුනාගන්නා බව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් කර ඇත.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

(අ) අනතුරටපත් වූ සභාව සතු බැකෝ යන්ත්‍රය වෙනුවෙන් ලද රු. 198,692 ක් වූ රක්ෂණ වන්දියසභාවේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ලැබිය යුතු උසාවි දඩ වෙනුවෙන් ඉදිරිපත් කළ උපලේඛණය අනුව රු.1,073,046ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු . 914,660ක් විය.

(ඇ) ගබඩා ගිණුම් ලෙජරය අනුව 2013 දෙසැම්බර් 31 දිනට හියුම් පයිප්ප ශේෂය රු. 107,350ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන අනුව එ දිනට ශේෂය රු. 48,746ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

හිඟහිටි බලපත්‍ර ගාස්තු රු. 109,700ක වටිනාකම හඳුනා ගැනීමට අදාලඋපලේඛණ හා විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනය සතුව පවතින රු. 370,050ක් වූ පරිගණක සහ උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104(1) | සභාව සතු බැකෝ යන්ත්‍රය අනතුරට පත් වී රු. 524,341ක අලාභයක් සිදු වී තිබුණ ද, එයට වගකිවයුතු අය නිශ්චය කිරීම, ප්‍රාරම්භක හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 1,943,628ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 2,143,983ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,087,611 ක පිරිහීමක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී ආදායම් ආධාර රු. 2,022,537කින් වැඩි වුව ද, වෙනත් ආදායම් ඉකුත් වර්ෂයට වඩා රු. 1,285,897කින් අඩු වීමත්, වර්ෂයේ වියදම් රු. 5,000,744කින් වැඩි වී තිබීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තත්‍ය ලැබීම් | 2013 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 509,980 | 334,830 | 247,166 |
| අක්කර බදු | 20,237 | 18,956 | 28,105 |
| බිම් කුලී | 11,400 | 15,300 | 43,250 |
| කඩ කාමර කුලී | 116,335 | 116,322 | 38,905 |

2.3.2 උසාවි දඩ

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 1,073,046ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09ක් සඳහා ප්‍රතිපාදිත රු. 83,000 කින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) රජයේ හා වෙනත් ආයතනවල පොලී ගෙවීමට වැය විෂයකට වෙන් කළ රු. 1,000,000කප්‍රතිපාදනවලින් රු. 750,000 ක් එනම් සියයට 75 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු රු. 159,172 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) බිම් කට්ටි කුලී රු.43,250 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීමෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබා ඇති අලාභය රු. 1,627,684 ක් විය.

3.2 නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ තීරණය පරිදි කල්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පැවති ට්‍රැක්ටර් හා උපකරණ 31 ක් සභාවට ලැබී තිබූ අතර, එම වත්කම් ලේඛණගත කර නොතිබුණු අතර 2014 මාර්තු මස දක්වාම ඒවා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු කොන්ක්‍රීට් මිශ්‍රණයක් වසර කිහිපයක සිට අක්‍රියව පැවතුණි.

(ඇ) සභාව සතු පැරණි කැබ් රථයක් වසර කිහිපයක සිට සභා පරිශ්‍රය තුල දිරාපත් වෙමින් පැවතුණි.

(ඈ) සභාව සතු වූ යතුරු පැදියක් කොටස් ගලවා පසෙක ලා තිබුණි.

4. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) මූල්‍ය කළමනාකරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ගබඩා පාලනය